2. පුද්ගලයන්ගේ තහවුරු කරන ලද දත්ත හා තොරතුරු රජයේ හා පිළිගත් පෞද්ගලික ආයතන අතර හුවමාරු කිරීම සඳහා පහසුකම් සලසා ඇත. මේ සඳහා API හා LOOKUP සේවා පහසුකම්වලින් පුද්ගලයන්ගේ තොරතුරු තහවුරු කර ගැනීමට පහසුකම් සැලසීම තුලින් ව්‍යාපාරිකයන්ට මෙන්ම ගණුදෙනුකරුවන්ට වඩාත් කාර්යක්ෂම විශ්වාසදායී සේවාවක් සලසා ගැනීමට මෙමඟින් අවස්ථාව සැලසී තිබේ. මේ වන විට LOOKUP සේවා සැපයීමට ගිවිසුම් ගත ආයතන 98 ක් සහ API සේවා සැපයීමට ආයතන 10 ක් ගිවිසුම් ගත වී ඇත. ශ්‍රී ලංකාව ඩිජිටල් ආර්ථිකයක් කරා යන ගමනේ මූලික පසුබිම මෙමඟින් ආවරණය වේ.

3. ජාතික ආරක්ෂාව හා රටේ සංවර්ධන ක්‍රියාවලිය සඳහා පුද්ගලයන්ගේ තොරතුරු මාර්ගගත ක්‍රමවේදය භාවිතා කරමින් සත්‍යාපනය කිරීම හේතුවෙන් සේවා ලබා ගැනීමට පැමිණෙන පුද්ගලයන්ට කාර්යක්ෂම හා විශ්වාසනීය සේවයක් ලබා ගැනීමට හැකිවීම.

4. දෙපාර්තමේන්තු කාර්යයන් බොහෝමයක් මාර්ගගත ක්‍රමවේදය හරහා සිදු කිරීම හේතුවෙන් කඩදාසි භාවිතය අවම කිරීම තුලින් කාන්තාරකරණය සිදුවීම වැලැක්වීම සඳහා සක්‍රීය දායකත්වයක් ලබා දීමට හැකිවීම.

5. දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය කාර්යාලවල වැඩ අවසන් ඉල්ලුම්පත් තැපැල් මගින් ප්‍රධාන කාර්යාලය වෙත යොමු කිරීමේදී තැපැල් ගාස්තු විශාල වශයෙන් ඉහල යාම මත දෙපාර්තමේන්තුවට ඇති කරන බලපෑම මගහැරීම සඳහා ඊට විසඳුමක් ලෙස පිරිවැය අවම වන පරිදි සකසන ලද ප්‍රවාහන සැලැස්මකට අනුව දෙපාර්තමේන්තුවේ රථයක් මගින් වැඩ අවසන් ඉල්ලුම්පත් ප්‍රධාන කාර්යාලය වෙත රැගෙන ඒම සිදුකරන ලද අතර, ඒ තුලින් 90%කට අධික පිරිවැය වාසියක් දෙපාර්තමේන්තුව වෙත අත්කරදීමට හැකියාව ලැබීම.

6. ඉතා නිවැරදි හා ආරක්ෂිත ජාතික හැඳුනුම්පතක් හඳුන්වාදීම සඳහා 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත සංශෝධනය කිරීමට කටයුතු කිරීම හා එම පනත ක්‍රියාත්මක කරවීම සඳහා අවශ්‍ය නියෝග මාලාවක් සකස් කිරීම තුලින් වඩාත් කාර්යක්ෂම මහජන සේවාවක් සැපයීමට අවස්ථාව ලැබීම.

**අභියෝග :**

1. දෙපාර්තමේන්තුව තුල දිනපතා එකතුවන ඉල්ලුම්කරුවන් විසින් ආපසු බාරදෙනු ලබන පැරණි හා ප්‍රතික්ෂේපිත හැඳුනුම්පත් පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත වන හෙයින් ඒවා පරිසර හිතකාමී හා ආරක්ෂිත අයුරින් විනාශ කිරීම සිදුකළ යුතු අතර ඒ සඳහා පහසුකම් ඇති ආයතන සීමිත වීම හේතුවෙන් අපහසුතාවයට ලක්වීම.

2. දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලවල වැඩ අවසන් ඉල්ලුම්පත් ප්‍රධාන කාර්යාලය වෙත යොමු කිරීමේදී තැපැල් වියදම් විශාල වශයෙන් ඉහල යාම සහ ඒ වෙනුවෙන් ලබාදෙනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත දෙපාර්තමේන්තු පිරිවැය කළමනාකරණයේදී අනවශ්‍ය පීඩනයක් ඇතිවීම.

# පරිච්ඡේදය 06
# මානව සම්පත් පැතිකඩ

## 6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු ** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 31 | 23 | 8 |
| තෘතීයික | 4 | 3 | 1 |
| ද්විතියික | 1,288 | 1,192 | 96 |
| ප්‍රාථමික | 149 | 103 | 46 |

## 6.2. ** ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපාන ආකාරය

දෙපාර්තමේන්තුවේ දැනට පවතින මානව සම්පත් හිඟය ආයතනයේ කාර්ය සාධනය සඳහා සෘණාත්මක බලපෑමක් ඇති කිරීම වළක්වනු පිණිස ක්‍රියාමාර්ග කිහිපයක් දියත් කර ඇත. එනම්,

- ජාතික හැඳුනුම්පත් සකස් කිරීම සඳහා යොදාගන්නා පරිගණක පද්ධතිය මිනිස් ශ්‍රමය අවම වන පරිදි වැඩිදියුණු කිරීමට කටයුතු කිරීම.
- දෙපාර්තමේන්තු නිලධාරීන් අතිකාල සේවයේ යෙදවීම.

ඒ අනුව, දෙපාර්තමේන්තුවේ දැනට පවතින සේවක පුරප්පාඩු ඉහත දක්වා ඇති ක්‍රම මඟින් කළමණාකරනය කරනු ලබන අතර මෙම පුරප්පාඩු පුරවා ගැනීම සඳහා අදාළ බලධාරීන් වෙත දිගින් දිගටම ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.

## 6.3. මානව සම්පත් සංවර්ධනය

| අනු අංකය | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (රු. 000) (දේශීය) | වැඩ සටහනේ ස්වභාවය | නිමැවුම්/ ලබාගත් දැනුම * |
|---|---|---|---|---|---|---|
| 1. | කලමනාකරණ සේවා නිලධාරින් සඳහා ආයතන සංග්‍රහයේ විධිවිධාන සහ කාර්යාල ක්‍රම පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන | 40 | දින 01 | 31,390.00 | දේශීය | අදාළ නිලධාරින්ගේ ඉහළ කාර්යසාධනය |
| 2. | නියෝජ්‍ය හා සහකාර කොමසාරිස්වරුන් සඳහා අංක තහවුරු කිරීමේ හා නීති අංශයේ කාර්යභාරය හා කාර්ය ක්‍රියාවලිය පිළිබඳව දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන | 12 | දින 02 | 3,960.00 | දේශීය | අදාළ නිලධාරින්ගේ ඉහළ කාර්යසාධනය |
| 3. | 2024 වාර්ෂික ස්ථානමාරු යටතේ මෙම දෙපාර්තමේන්තුව වෙත ස්ථානමාරුවී පැමිණි නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන | 50 | දින 03 | 71,800.00 | දේශීය | දෙපාර්තමේන්තුවට ක්ෂණිකව අනුගත වූ නවක නිලධාරි පිරිස සහ අඛණ්ඩ කාර්යක්ෂම මහජන සේවය |
| 4. | මෙම දෙපාර්තමේන්තුවේ ආරක්ෂක රාජකාරියෙහි නිරතවන සිවිල් ආරක්ෂක නිලධාරීන් සඳහා ඵලදායී මහජන සේවයක් ලබාදීම පිළිබඳ ආකල්ප සංවර්ධන පුහුණු වැඩසටහන | 11 | දින ½ | 1,950.00 | දේශීය | අඛණ්ඩ කාර්යක්ෂම මහජන සේවය |
| 5. | අනුමත කිරීම් රාජකාරිවල නිරත වන නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන | 30 | දින 01½ | 5,670.00 | දේශීය | කාර්යක්ෂමතාව නංවා එක්දින සේවාවට ගතවන කාලය අවම කිරීම හා දෝෂ අවම කිරීමේ ව්‍යාපෘතිය සඳහා ප්‍රවේශය |
| 6. | රියදුරන් හා කාර්යාල කාර්ය සහායකයින් සඳහා විනය හා කාර්යාලීය ආචාරවිධි පිළිබඳ පුහුණු වැඩ සටහන | 2 | දින 02 | 26,000.00 | දේශීය | අදාළ නිලධාරින්ගේ ඉහළ කාර්යසාධනය/ අභ්‍යන්තර හා බාහිර පාරිභෝගික සත්කාරයෙහි සාධනීය වර්ධනය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 7. | අභ්‍යන්තර විගණනය හා අභ්‍යන්තර පාලන ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන | 1 | දින 02 | 13,000.00 | දේශීය | අදාළ නිලධාරින්ගේ ඉහළ කාර්යසාධනය |
| 8. | රාජ්‍ය නිලධාරින්ගේ වැටුප් සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන | 3 | දින 01 | 15,000.00 | දේශීය | අදාළ නිලධාරින්ගේ ඉහළ කාර්යසාධනය |
| 9. | නිවාඩු භාර නිලධාරියාගේ කාර්යභාරය පිළිබඳ පුහුණු වැඩසටහන | 2 | දින 01 | 10,000.00 | දේශීය | අදාළ නිලධාරින්ගේ ඉහළ කාර්යසාධනය |
| 10. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ට අනුයුක්ත සංවර්ධන නිලධාරීන් සඳහා ලේඛන පරීක්ෂා කිරීම, අඩුපාඩු නැවත කැඳවීම සහ එක්දින සේවයට ඉල්ලුම්පත් යොමු කිරීම යන කාර්යයන් සම්බන්ධයෙන් Zoom තාක්ෂණය ඔස්සේ පැවති පුහුණු වැඩසටහන | 218 | දින 01½ | 12,950.00 | දේශීය | හැඳුනුම්පත් සකස් කිරීමේ ක්‍රියාවලියේදී පවතින ගැටලු අවම වීම |
| 11. | මුදල් රෙගුලාසි, රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය, ආයතන සංග්‍රහය සහ කාර්ය පටිපාටික රීති පිළිබඳ පුහුණු වැඩසටහන | 150 | දින 02 | 36,340.00 | දේශීය | අදාළ නිලධාරින්ගේ ඉහළ කාර්යසාධනය |
| 12. | දැනුම කළමනාකරණ පුහුණු වැඩසටහන | 46 | දින 01½ | 31,380.00 | දේශීය | දැනුම කළමනාකරණයේ ඇති පරතරයන් අවම කිරීම |
| 13. | පොදු නීතිය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 1 | වසර 01 | 99,000.00 | දේශීය | දැනුමෙන් පරිපූර්ණ ඉහළ කළමණාකාරිත්වය |
| 14. | Government Payroll System පිළිබඳ පුහුණු වැඩසටහන | 3 | දින 03 | 63,000.00 | දේශීය | දැනුමෙන් පරිපූර්ණ ඉහළ කළමණාකාරිත්වය |
| 15. | Cyber Security Awareness පුහුණු වැඩසටහන | 90 | දින ½ | 21,540.00 | දේශීය | පරිගණක දත්ත පද්ධතිය භාවිතයට අදාළ නව්‍ය දැනුම හා කුසලතා වර්ධනය |
| 16. | අවධානම් පාදක අභ්‍යන්තර විගණනය පිළිබඳ පුහුණු වැඩසටහන | 3 | දින 02 | 39,000.00 | දේශීය | දැනුමෙන් පරිපූර්ණ ඉහළ කළමණාකාරිත්වය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 17. | Two Day Workshop on Desktop Database Management in MS Access පිළිබඳ පුහුණු වැඩසටහන | 2 | දින 02 | 26,000.00 | දේශීය | දැනුමෙන් පරිපූර්ණ ඉහළ කළමණාකාරිත්වය |
| 18. | සරප්/ මුදල් අයකැමි තනතුරේ කාර්යය භාරය පිළිබඳ පුහුණු වැඩසටහන | 1 | දින 01 | 7,000.00 | දේශීය | විෂයය පිළිබඳ පූර්ණ දැනුමක් සහ හැකියාව තුලින් වඩාත් කාර්යක්ෂම ලෙස ගෙවීම් කටයුතු කිරීමේ හැකියාව |
| 19. | රාජ්‍ය හා රාජ්‍ය අනුබද්ධ ආයතන සඳහා බඳවාගත් නවක කලමනාකරණය නිලධාරීන්/සංවර්ධන නිලධාරීන් සඳහා කාර්යාල ක්‍රමවේද හා ආචාරධර්ම පිළිබඳ පුහුණු වැඩසටහන | 2 | දින 02 | 26,000.00 | දේශීය | විෂයය පිළිබඳ පූර්ණ දැනුමක් සහ අභ්‍යන්තර හා බාහිර පාරිභෝගික සත්කාරයෙහි සාධනීය වර්ධනය |
| 20. | පරිපාලන නිලධාරීන් සතු වගකීම හා කාර්ය භාරය පිළිබඳ පුහුණු වැඩසටහන | 2 | දින 02 | 26,000.00 | දේශීය | දැනුමෙන් පරිපූර්ණ ඉහළ කළමණාකාරිත්වය |
| 21. | මූලික විමර්ශන පුහුණුව පිළිබඳ පුහුණු වැඩසටහන | 1 | දින 02 | 13,000.00 | දේශීය | විනය සම්බන්ධයෙන් අවශ්‍ය දැනුම ලබාගත හැකිවීම මානව සම්පත පූර්ණත්වයට පත්වීම |
| 22. | මුදල් රෙගුලාසි 104 අලාභ වාර්තා කිරීම, හානි පූර්ණය හා ගිණුම් තැබීම පිළිබඳ පුහුණු වැඩසටහන | 7 | දින 02 | 91,000.00 | දේශීය | වත්කම් කළමනාකරණය හා නඩත්තු කිරීමට අදාළ නිලධාරින්ගේ ඉහළ කාර්යසාධනය |
| 23. | නිෂ්පාදන සහායක සහ ලේඛන සහායක 11 ශ්‍රේණියේ තනතුරු සඳහා පැවැත්වීමට නියමිත දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය වෙනුවෙන් | 11 | - | 34,180.00 | දේශීය | දෙපාර්තමේන්තු ගත පත්වීම්ලාභී නිලධාරින්ගේ සේවා ස්ථාවරත්වය සඳහා වූ දැනුම තුලින් කාර්යක්ෂමතාවය ඉහල නැංවීමට අවශ්‍ය පහසුකම් සපයාදීම |
| 24. | ආයතන කාර්යය පටිපාටිය පිළිබඳ උසස් සහතික පත්‍ර පුහුණු පාඨමාලාව | 03 | දින 12 | 108,000.00 | දේශීය | දැනුමෙන් පරිපූර්ණ ඉහළ කළමණාකාරිත්වය |
| 25. | රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ සහතික පත්‍ර පුහුණු පාඨමාලාව | 01 | දින 10 | 40,000.00 | දේශීය | නිරවද්‍යව ප්‍රසම්පාදන ක්‍රියාවලිය මෙහෙයවීම |
| 26. | වර්තමාන කාර්යාලක්‍රම හා කාර්යාල කළමනාකරණ පුහුණු වැඩසටහන | 11 | දින 02 | 143,000.00 | දේශීය | දැනුමෙන් පරිපූර්ණ ඉහළ කළමණාකාරිත්වය |

**ආයතනයක ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කිරීම සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම**

ආයතනයක ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කිරීම හමුවේ ආයතනයක මානව සම්පත වඩාත් කාර්යක්ෂමව සහ ඵලදායීව යොදා ගැනීම සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැදගත් වේ. මෙහිදී සේවාදායකයාගේ දැනුම වර්ධනය (ඉගැන්වීම) සිදුකෙරෙන අතර, මෙම දැනුම වර්ධනය මගින් සැබැවින්ම සිදුවන්නේ රැකියාවෙහි සාර්ථකත්වය ඉටු කරගැනීම සඳහා අවශ්‍ය දැනුම, කුසලතාවය සහ ආකල්ප වර්ධනය කිරීමයි.

ඒ අනුව සේවාදායකයාගේ දැනුම, කුසලතාවය හා ආකල්ප වර්ධනය වීමෙන් සේවක හැකියාවන් ඍජුවම වැඩිදියුණු වෙයි. හැකියාව වැඩි වනවිට සේවකයාගේ ආත්මාභිමානය, ආත්ම විශ්වාසය හා සේවක තෘප්තිය වැඩි වන අතර එමගින් සේවක අභිප්‍රේරණය වැඩි වේ. එමෙන්ම, මෙම සෑම ගුණාංගයක් හේතුවෙන්ම සේවාදායකයාගේ කාර්යඵලය ඉහළ යනු ඇත. මේ අනුව ආයතනය සිය සේවාදායකයන්ගේ පුහුණු අවශ්‍යතාවය අනුව පුහුණු වැඩසටහන් සම්පාදනය කිරීම හෝ එවැනි පුහුණු වැඩසටහන් සම්පාදනය කර ඇති ආයතන කෙරෙහි සිය සේවාදායකයන් යොමුකිරීම සිදු කරනු ලැබේ.

තවද, අඛණ්ඩව සිදුකරන පුහුණු වැඩසටහන් තුලින් දෙපාර්තමේන්තුවේ නිලධාරින් අතර ඇති සුවිශේෂී දැනුම හා කුසලතාවන් අන් අය වෙත ප්‍රේෂණයවීමත්, සමස්ත ක්‍රියාවලිය තුල වඩා කාර්යක්ෂම හා දැනුවත් මානව සම්පතක් බිහි කර ගැනීමටත් අපේක්ෂා කෙරේ.

# පරිච්ඡේදය 07
# අනුකූලතා වාර්තාව

| අංකය | අදාල කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ / ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මුල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මුල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | - | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.6 | වෙනත් | - | | |
| 2 | **පොත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන /පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.9 | හානි හා පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA- N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 3 | **මුල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මුල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මුල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක්වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 9.2 | වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ | | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| 12 | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | **නිරවුල් නොකරන ලද ණය ශේෂයන් හා ඊට අදාළ හේතුව : 01.ඩී.එම්.ආර්.දිසානායක මයා - කාර්යාල සේවක සේවය - ණය ශේෂය රු.45,412.69 - සේවයෙන් පහකර ඇත.** මෙම නිලධාරියා සේවයෙන් පහකිරීමෙන් අනතුරුව 2021.08.03 දින විදේශ ගත වී ඇත. 2023. 01.09 වන දින ඔහුගේ බිරිඳ විසින් ණය මුදලින් කොටසක් සහ පොළිය වශයෙන් රු.35,000.00 ක මුදලක් ගෙවා ඇත. 2024.12.31 දින වන විට රු.45,412.69 ක ශේෂයක් අයකර ගතයුතුව පවතින බැවින් නීතිපතිවරයා මගින් නඩු පවරා ඇත. එහිදී ඒ සඳහා අවසන් වරට 2024.11.19 වන දින දෙපාර්තමේන්තු නීති නිලදාරී පෙනී සිට ඇති අතර 2025.04.01 දින එම නඩුව නැවත කැඳවන බව දන්වා ඇත. | මෙය පාලනය කළ නොහැකි තත්ත්වයකි. |
| | | | **02. පී.ටී.ඒ.එස්. ද පීරිස් මිය -කාර්යාල සේවක සේවය - ණය ශේෂය රු. 148,000.00 - සේවයෙන් පහකර ඇත.** මෙම නිළධාරියාගේ ණය වාරිකය වන රු.2,550.00 ක මුදල සහ පොළිය ඔහුගේ ඇපකරු වන දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු කේ.ජී.ඩී.උපුල් නිශාන්ත යන අයගේ වැටුපෙන් අවකරණය කර අප වෙත ගිණුම්ගත කරනු ලබයි. ඒ අනුව එම නිලධාරිනියගේ ණය වාරිකය මේ වන විට අය වේ. | මෙය පාලනය කළ නොහැකි තත්ත්වයකි. |

| | | | | |
|---|---|---|---|---|
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2008(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කිරීම | අනුකූල වේ | | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 හා 2023.11.30 දිනැති 02/2018((I) හි මාර්ගෝපදේශය අනුව මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකටම අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ අංක 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල නොවේ | 2023.11.30 දිනැති රා.ප.ච.ලේ. 02/2018(I) හි 03 ඡේදය පරිදි | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | |
| 20 | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |

# ඇමුණුම - 01

EG-682

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | JLO/E/DRP/FS/2024/01 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2025 මැයි 30 දින |

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ
කොමසාරිස් ජනරාල්
3 0 MAY 2025
ஆட்களை பதிவுச் செய்யும்
ஆணையாளர் நாயகம்

කොමසාරිස් ජනරාල්
පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

**ශීර්ෂය 227 - පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

-----------------------------------------------------------------------------------------------------------

යථෝක්ත වාර්තාව හා මූල්‍ය ප්‍රකාශනයේ මුල් පිටපත (සිංහල, ඉංග්‍රීසි, දෙමළ) මේ සමඟ එවා ඇත.

Acct - Pay / Pro
T. N. A
2
06.03

යූ.එන්. අලුත්ගේ
ජ්‍යෝෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට (වැ.බ)

Shashik
6/4

පිටපත :- අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

CA
05/30.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. JLO/E/DRP/FS/2024/01    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date 2025 මැයි දින

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්
30 MAY 2025
ஆட்களை பதிவும் செய்யும் ஆணையாளர் நாயகம்

කොමසාරිස් ජනරාල්

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

**ශීර්ෂය 227 - පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 227- පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථාකාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලටඅදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

CA 25/30.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එමනිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කරඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

**1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය

ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු ය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරි දැනුවත් කරමි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ආදායම්**

2024 වර්ෂය සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ඡායාරූපාගාර ලියාපදිංචි කිරීම තුළින් උපයාගත් රු.6,534,356ක ආදායම පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ආදායම් ශීර්ෂය වන 2003.02.03 යටතේ බැරකිරීමකින් තොරව 2003.99.00 වන වෙනත් ලැබීම් ආදායම් ශීර්ෂයට බැරකර තිබුණි.

**1.6.2 පුනරාවර්තන වියදම්**

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයන්හි මූලික සහ සංශෝධිත වියදම් ඇස්තමේන්තු අතර විචලතාව පැහැදිලි කිරීම (ACA 2-iii) තුළ මුළු පුනරාවර්ථන වියදම්වල එකතුවෙහි වෙනස රු.112,455,000ක් වුවද, එම අගය රු.105,391,000ක් ලෙස දක්වා තිබුණි.

(ආ) PE - 1266 කැබ්රථය සඳහා බැටරියක් යෙදීම වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට රු.37,977ක බැරකමට එළඹී තිබුණි. 2025 ජනවාරි මස 24 වන දින එම මුදල පියවා තිබූ නමුත්, එම වියදම 227-01-01-1409-140 විවිධ සේවා වියදම් යටතේ ගිණුම්ගතකර තිබුණි.

(ඇ) CAN - 6891 කාර්රථයේ වාර සේවාව වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට රු.73,679ක බැරකමකට එළඹී තිබුණි. 2025 ජනවාරි 24 වන දින එම මුදල පියවා තිබූ නමුත්, එය වියදම 227-01-01-1409-140 විවිධ සේවා වියදම් යටතේ ගිණුම්ගතකර තිබුණි.

**1.6.3 මූල්‍ය නොවන වත්කම්**

(අ) 2024 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් වාර්තාව (SA 82) අනුව දෙපාර්තමේන්තුව සතු මුළු වාහන සංඛ්‍යාව 15ක් වුවද, විගණනයට ලද තොරතුරු අනුව දෙපාර්තමේන්තුව සතු වාහන සංඛ්‍යාව 13ක් ලෙස ඉදිරිපත්කර තිබුණි. ඒ අනුව වාහන අංක KB 8577 හා KH 3686 යන මෝටර් කාර් 02ක වෙනසක් පවතී.

(ආ) 2024 දෙසැම්බර් 31 දිනට සිදුකර තිබූ භාණ්ඩ සමීක්ෂණය මගින් හඳුනාගන්නා ලද අපහරණය කළ යුතු භාණ්ඩ අතරින් 2024 අප්‍රේල් 26 දින වෙන්දේසි කිරීම මගින් වත්කම් වර්ග 08කට අදාළ අයිතම 64ක් සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් වාර්තාවේ (SA 82) අපහරණයන් තුළ දක්වා නොතිබුණි.

(ඇ) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්ගේ නමට ලියාපදිංචිකර තිබූ අංක NB 4809, NB 4840 දරන වෑන් රථ 02ක් හා අංක CAQ 5803 දරන මෝටර් කාර් 01ක් යන වත්කම් සිගාස් වැඩසටහනට ඇතුළත්කර නොතිබුණි.

**2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මකකර තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙනුවෙන් වෙනත් දෙපාර්තමේන්තුව විසින් රැස් කළ ආදායම, භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව රු.461,335,376ක් හා ආදායම් ඉපැයීම පිළිබඳ ප්‍රගති වාර්තාව අනුව රු.462,755,280ක් වූ බැවින්, රු.1,419,904ක වෙනසක් පැවතුණි.

3.2 වියදම් කළමනාකරණය

(අ) සමාලෝචිත වර්ෂය සඳහා මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.2,855,955,000ක් වූ අතර, භාණ්ඩාගාර මුද්‍රිත සටහන් (SA 10) අනුව මුළු වියදම රු.1,988,220,703ක් වූ බැවින්, වර්ෂය අවසානයට සමස්ත ඉතිරිය රු.867,734,297ක් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් 30ක් විය.

(ආ) පුනරාවර්තන වැය විෂයයන් 05ක් හා මූලධන වැය විෂයයකට අදාළව මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.1,110,885,280ක මුදලකින් රු.764,467,077ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානයට ඉතුරුම් ලෙස පැවති අතර, එම ඉතිරිය සියයට 41 සිට සියයට 84ක පරාසයක පැවතුණි.

(ඇ) මුදල් රෙගුලාසිය 50 ප්‍රකාරව හැකිතාක් සම්පූර්ණ හා නිවැරදිව ඇස්තමේන්තු පිළියෙළ නොකිරීම හේතුවෙන් මුදල් රෙගුලාසි 66 යටතේ ප්‍රතිපාදන මාරුකරගෙන තිබූ අතර, එලෙස හුවමාරුකර ගන්නා ලද අමතර ප්‍රතිපාදන, ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 32 සිට සියයට 117ක පරාසයක පැවති බැවින්, ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී නිසිඅවධානයක් සිදුකර නොතිබුණි.

3.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

2024/11/27 දින සිට 2024/12/26 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව මුද්‍රණයට යොමුකරන ලද ඉල්ලුම්පත්‍ර වෙනුවෙන් වූ 2024/12/31 දිනැති ඉන්වොයිසිය සඳහා 2025 පෙබරවාරි 05 දින රු.2,857,441ක මුදලක් ගෙවා තිබුණ ද, 2024 වර්ෂය අවසානයට එම මුදල බැරකමක් ලෙස භාණ්ඩාගාර මුද්‍රිත සටහන් (SA 92) හි ඇතුළත් කර නොතිබුණි.

3.4 **නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| **නීතිරීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| රාජ්‍ය මුදල් චක්‍රලේඛ<br>2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020, 04 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස්කොට ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අනුමැතිය ලබාගත යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් පිළියෙලකර තිබූ ප්‍රසම්පාදන සැලැස්ම, නියමිත දිනයෙන් පසු දිනයක් වූ 2024 ජනවාරි 04 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් අනුමත කර තිබුණි. |

3.5 **තැන්පතු**

මුදල් රෙගුලාසි 565(4) ප්‍රකාරව එක් එක් මුදල් වර්ෂය සඳහා අලුත් තැන්පතු ලෙජරයක් විවෘත කිරීමේදී තැන්පතු ලෙජරයේ එක් එක් ගිණුමේ ශේෂය සැඳුම්ගන්නා එක් එක් විෂයය වෙන වෙනම අලුත් ලෙජරයට ගෙන යා යුතු වුවද, ගිණුම් අංක 6000-0-0-18-0-30 ව්‍යවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් වූ තාවකාලික රඳවාගැනීම් වූ රු.52,603ක ආරම්භක ශේෂය සැඳුම්ගන්නා ආකාරය පොදු තැන්පතු ලෙජරයේ 2024 ජනවාරි 01 දිනට වෙන වෙනම දක්වා නොතිබුණි.

4. **මෙහෙයුම් සමාලෝචනය**

4.1 **කාර්යසාධනය**

4.1.1 **අපේක්ෂිත නිමවුම් මට්ටම ලබානොගැනීම**

(අ) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යසාධක දර්ශක ( $KPI_S$ ) තුන අතරින් ප්‍රධාන දර්ශකයක් වන "වාර්ෂික සාමාන්‍ය සේවය යටතේ ලද අයදුම්පත් හා නිකුත් කළ ජාතික හැඳුනුම්පත් සංඛ්‍යාව" සමාලෝචිත වර්ෂයේ ප්‍රතිශතයක් ලෙස සියයට 21ක් බව නිරීක්ෂණය වූ නමුත්, 2024 කෙටුම්පත් කාර්යසාධන වාර්තාවේ උක්ත කාර්යසාධන දර්ශකයේ ප්‍රතිශතය සියයට 75-89ක් අතර බවට වාර්තාකර තිබුණි.

(ආ) 2016 අංක 08 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතේ 5(2)(1) වන හා 15(14)වන වගන්ති ප්‍රකාරව, ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන සහ වයස අවුරුදු 15ට එළැඹ ඇති හෝ එළැඹෙන සෑම තැනැත්තෙකුටම කොමසාරිස් ජනරාල්වරයා විසින් ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් එම තැනැත්තාට ජාතික හැඳුනුම්පතක් නිකුත් කළයුතු වුවද,2024 ජනවාරි 01 දිනට ජාතික හැඳුනුම්පතක් නිකුත් නොකරන ලද අයදුම්පත් 1,055,461ක් පැවතුණි. සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුව වෙත අයදුම්පත් 985,209ක් ලැබී තිබූ බැවින් මුළු අයදුම්පත් 2,040,670ක් සඳහා ජාතික හැඳුනුම්පත් නිකුත් කළයුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී නිකුත් කළ ජාතික හැඳුනුම්පත් ප්‍රමාණය 431,960 විය. 2024 දෙසැම්බර් 31 දිනට ජාතික හැඳුනුම්පතක් නිකුත් නොකරන ලද අයදුම්පත් 1,608,710ක් පැවති අතර, එදිනට දෙපාර්තමේන්තුව සතුව පැවති පෙර මුද්‍රිත කාඩ්පත් ප්‍රමාණය 667,820ක් පමණක් විය. ඒ අනුව ප්‍රමාණවත් පෙර මුද්‍රිත කාඩ්පත් ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි. මීට අමතරව සමාලෝචිත වර්ෂයේදී පාසල් අයදුම්කරුවන් සඳහා තොරතුරු තහවුරු කිරීමේ ලිපි 588,402ක් නිකුත් කර තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාණවත් පරිදි පෙර මුද්‍රිත කාඩ්පත් තොග පවත්වා නොගැනීම නිසා සමාලෝචිත වර්ෂය තුළදී ජාතික හැඳුනුම්පත වෙනුවට තොරතුරු තහවුරු කිරීමේ ලිපි නිකුත් කර තිබුණි. ඒ අනුව පාසල් අයදුම්කරුවන් වෙත තහවුරු කිරීමේ ලිපි 588,402ක් හා මැතිවරණයේදී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ජාතික හැඳුනුම්පත වෙනුවට තොරතුරු තහවුරු කිරීමේ ලිපි නිකුත් කර තිබුණි.

### 4.2 ප්‍රසම්පාදනයන්

(අ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3 (ආ) ප්‍රකාරව, තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීම් වාර්තා සටහන් කවර හෝ සාමාජිකයකුට තමන් එකඟ නොවන බව වාර්තාගත කළ හැකි අතර,කේත කියවන යන්ත්‍ර (QR readers) 75ක් මිලදීගැනීමට අදාළව 2024 පෙපබරවාරි 5 දින පැවැති 01 වන තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවෙහි සභාපති විසින් එකඟ වීම හෝ එකඟ නොවීම සඳහන් නොකර අත්සන් තබා තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් කේත කියවන යන්ත්‍ර (QR readers) 75ක් ප්‍රසම්පාදනය සඳහා පත්කර ඇති තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.12 (අ) ප්‍රකාරව, නියමිත ආකෘතිපත්‍රයෙහි වූ ප්‍රකාශයන්ලබාදී නොතිබුණි.

### 4.3 කළමනාකරණ දූර්වලතා

(අ) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ 2024 ජනවාරි සිට ජූලි දක්වා සාමාන්‍ය සේවය යටතේ මුද්‍රණය කරන ලද ජාතික හැඳුනුම්පත්වලින් දෝෂ සහිත හැඳුනුම්පත්වල මාසික සාමාන්‍ය අගය 377ක් වූ නමුත්, 2024 අගෝස්තු මාසයේදී දෝෂ සහිත කාඩ්පත් 752 ක් මුද්‍රණය වී තිබූ බැවින් 2024 අගෝස්තු මාසයේ දී දෝෂ සහිත කාඩ්පත් මුද්‍රණයවීමේ අසාමාන්‍ය වැඩිවීමක් දක්නට ලැබුණි.

(ආ) ජාතික හැඳුනුම්පත් තොරතුරුවල සත්‍යතාව සහතික කිරීමේ මාර්ගගත ක්‍රමවේදය සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.1 ඡේදය ප්‍රකාරව තොරතුරු සහතික කිරීම සඳහා ඉදිරිපත් වූ ඉල්ලීම් සංඛ්‍යාව මත පදනම්ව දෙපාර්තමේන්තුව විසින් මාසිකව අදාළ ආයතන වෙත ඉන්වොයිසියක් නිකුත්කර තිබුණි. ඉන්වොයිසිය නිකුත්කළ දින සිට දින 14ක් ඇතුළත ගෙවීම් සිදුකළ යුතු වුවද, එසේ නියමිත දිනට පෙර ගෙවීම් සිදුකර නොතිබූ අවස්ථා නිරීක්ෂණය වූ අතර මාස 01 සිට මාස 09 දක්වා ප්‍රමාද කාලයක් ගතවී තිබුණි.

(ඇ) 2016 අංක 8 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතින් සංශෝධිත 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 39 (ආ) (ඇ) ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තුව යම් නියමිත අධිකාරියක් විසින් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් සඳහා ජාතික හැඳුනුම්පත දරන්නාගේ කැමැත්ත සහිතව එම හැඳුනුම්පත දරන්නා පිළිබඳ විස්තරවල සත්‍යතාවය සහතික කරනු ලැබිය හැකි අතර, දෙපාර්තමේන්තුව සමඟ අවබෝධතා ගිවිසුම් (MOU) වලට එළැඹි ආයතන විසින් ජාතික හැඳුනුම්පත දරන්නාගේ කැමැත්ත ලබාගැනීමෙන් අනතුරුව තොරතුරු සත්‍යාපනයකර ගැනීම සිදුකළ යුතුවේ. නමුත් ගිවිසුම්ගත ආයතන විසින් පුද්ගලයන්ගේ තොරතුරු සත්‍යාපනයකර ගැනීමේදී ජාතික හැඳුනුම්පත දරන්නාගේ කැමැත්ත සත්‍ය වශයෙන්ම ලබාගෙන ඇත්ද, යන්න පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් නියැදි පරීක්ෂාවක් හෝ මෙම සේවාව ආරම්භයේ සිට විගණිත දින දක්වාම සිදුකර තිබූ බවට විගණනයේදී තොරතුරු අනාවරණය නොවුණි.

(ඈ) නිලධාරියකුගේ වසර 10කට වැඩි කාලයක දෙපාර්තමේන්තුවට අයවිය යුතු ආපදා හා පාපැදි ණයශේෂය රු.45,413ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද නිරවුල්කර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි.

(ඉ) 2024 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවට අයවිය යුතු සේවය අතහැර ගොස් ඇති නිලධාරින් තිදෙනෙකුගේ මුළුණය ශේෂය රු.551,673ක් විය. මින් 2023 මැයි මස 10 දින සේවය අතහැර ගිය නිලධාරියකුගේ රු.148,000ක ආපදා ණයශේෂය වසර 3-5 කාලයක් තුළ නිරවුල් නොවී 2024 දෙසැම්බර් 31 දින වනවිට ද පැවතුණි.

(ඊ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ සංවර්ධන නිලධාරියෙකු ලෙස සේවය කරන ලද J.M බුද්ධි මයා 2017 අගෝස්තු 29 දින සේවය හැර ගොස් තිබුණි. 2014/2015 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම යටතේ ක්ෂේත්‍ර නිලධාරින් සඳහා යතුරුපැදි ලබාදීමේදී මොහු විසින් යතුරුපැදියක් ලබාගෙන තිබුණ ද, එය ලබාගෙන වසර 05ක් ගතවීමට පෙර සේවය හැරගොස් ඇති බැවින් ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක: BD/GPS/130/9/14/MC- IIහා 2015 ජුලි 07 ලිපිය ප්‍රකාරව ඔහුගෙන් යතුරුපැදියේ වෙළඳපොළ වටිනාකම වන රු.144,920ක මුදල අයකරගත යුතුව ඇතත්, එසේ අයකර ගැනීම හෝ පොත්වලින් එකී වටිනාකම කපාහැරීමක් සිදුව නොතිබූ අතර, ඒ පිළිබඳ තොරතුරු කිසිවක් 2024 මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් නොවුණි.

(උ) 2023 වර්ෂයේදී ජාතික හැඳුනුම්පත් මිලියන 05ක් මිලදීගැනීමට අදාළව, 2023 නොවැම්බර් 01 දින පළකරන ලද ලංසු ආරාධනා පුවත් දැන්වීමේ 5 ඡේදය සංශෝධනය කර 2023 නොවැම්බර් 02 දින ද පුවත්පත් දැන්වීමක් පළ කර තිබූ අතර, එකම දැන්වීමේ සුළු වෙනස්කමක් සිදුකර එය ඊට පසුදින පළකිරීම කළමනාකරණ දුර්වලතාවයක් වන අතර ඒ සඳහා රු.62,349ක මුදලක් ගෙවීම්කර තිබුණි.

**5. මානව සම්පත් කළමනාකරණය**

**5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය**

(අ) 2024 දෙසැම්බර් 31 දිනට පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 1,472ක් වූ අතර, තථ්‍ය කාර්ය මණ්ඩලය 1,321ක් වූ බැවින්, පුරප්පාඩු 151ක් නිරීක්ෂණය විය.

| සේවා මට්ටම | අනුමත තනතුරු සංඛ්‍යාව | 2024.12.31 දිනට තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 31 | 23 | 8 |
| තෘතියික | 4 | 3 | 1 |
| ද්විතීය | 1,288 | 1,192 | 96 |
| ප්‍රාථමික | 149 | 103 | 46 |
| **එකතුව** | **1,472** | **1,321** | **151** |

(ආ) 2024 දෙසැම්බර් 31 දිනට පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්, අතිරේක කොමසාරිස් ජනරාල්, නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) හා නීති නිලධාරි ඇතුළු තනතුරු 08ක් සඳහා අනුමත සංඛ්‍යාවම පුරප්පාඩු ලෙස පැවතුණි.

යූ.එන්. අලුත්ගේ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට(වැ.බ)